C
377
HEW

# "ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් විෂයමාලාවෙන් වෘත්තීය නිපුණතා ලබාදීමේ අවශ්‍යතාව හා ඒ සඳහා තාක්ෂණ විෂයය තුළින් ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්" (මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල්වල 9-11 වසර නියැදියක් ඇසුරෙන්).

"A Critical study of the need for providing vocational competencies and the methods of imparting such competencies to students through technical subjects of the secondary school curriculum in Sri Lanka". (Based on a sample of students from year 9-11 of the secondary schools in Kandy District )

චිත්‍රාංගනී හේවාපතිරණ
[ B.Com (Hon), Dip Ed (Merit) ]

නිබන්ධන උපදේශක - ආචාර්ය සිල්වි සේනාධීර මහත්මිය
අධ්‍යාපන අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

අධ්‍යාපන දර්ශනපති උපාධි නිබන්ධනය
අධ්‍යාපන විද්‍යා අංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

1997

5080070

## ABSTRACT

This research study ascertains how technical subjects could be utilized to provide vocational competencies to Sri Lankan students at secondary school level.

The main sample of this study consisted of 400 students and 100 teachers in 10 schools in the Kandy District. Data collected by questionnaries were further verified by interviewing the principals of schools, subject specialists and educationists.

Data analyzed, tabulated and expressed in the form of graphs and tables, showed the popularity of technical subjects such as Agriculture, Commerce and Home Economics. Most of the students selected these subjects as a means of going for higher education.

Due to the scarcity of teachers and facilities in rural schools, these O/L students have been compelled to limit themselves to a few technical subjects taught in their schools.

G.C.E.(O/L) Examination performance, showed that failure rate of the technical subjects could be minimized by giving students freedom to select subjects.

Findings showed the wide ranging inadequacy of competencies of vocational subjects, the students needed practical work experience in government institutions, prior to the final examinations. Employers in the contemporary society view vocational competencies as a range of skills to handle any job rather than a particular job. To channel youth to a variety of avenues the dignity of labour should replace the stigma attached to vocational competencies.


UNIVERSITY OF PERADENIYA
6-8-1998

Proposals of this study summarizes the need of a educational philosophy that generates a vocational work ethic to produce committed patriotic Sri Lankan students from schools, without aspiring for higher education only.

As a means of achieving this goal the commencement of technical subjects at year 4 and the continuation of a variety of technical subjects till the advanced level were discussed. To overcome the current deficiencies in physical and human resources following measures have been suggested.

1. Enhanced educational expenditure to technical education.

2. Avenues of co-operation between the private sector of local as well as international institutes and the school.

3. Innovative changes needed in teacher training by making technical subjects compulsory.

4. Enlistment of retired teachers of technical subjects.

5. Linking of vocational skills of employers with school [illegible]

6. Guidance and counselling service for students.

7. Maintaining and publicizing an inventory of job opportunities.

8. Vocational training institutes at regional level.

These short term and long term proposals mean to overcome deficiency of job opportunities for students who are joining the job market after leaving [illegible] school.

# සාරාංශය


කාලීන රැකියා අවශ්‍යතා හා ගැළපෙන අයුරින් සිසුන්ට වෘත්තීය නිපුණතා ලබා දීම සඳහා තාක්ෂණ විෂයයේ මනා ක්‍රියාකාරීත්වයක් අවශ්‍යය. එබැවින් වර්තමාන ද්විතීයික පාසල් විෂයමාලාවෙන් වෘත්තීය නිපුණතා ලබාදීම හා ඒ සඳහා තාක්ෂණ විෂයය තුළින් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ විමසා බැලීමක් මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ.

මේ සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල මාධ්‍යය පාසල් දශයක 9,10,11 වසර සිසුන් 400 ක ගෙන් හා තාක්ෂණ විෂයය උගන්වන ගුරුවරුන් ඇතුළු ද්විතීයික පාසල් වල ගුරුවරුන් 100 ක ගෙන්, ප්‍රශ්නාවලි මගින් දත්ත ලබාගන්නා ලදි. එම දත්ත වගු, ප්‍රතිශත හා ප්‍රස්තාර මගින් විශ්ලේෂණය කරන ලදි. සිසුන් හා ගුරුවරුන් ගෙන් ලබා ගත් දත්ත වැඩි දුරටත් විමර්ශනය කිරීම සඳහා විදුහල්පතිවරුන්, අධ්‍යාපනඥයන් හා විෂයය විශේෂඥයන් සමග සාකච්ඡා පවත්වන ලද අතර, එම ප්‍රතිචාර ගුණාත්මකව විශ්ලේෂණය කෙරිනි.

තාක්ෂණ විෂයයේ වර්තමාන ස්වභාවය පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමේදී, කෘෂිකර්මය, වාණිජ්‍ය හා ගෘහ ආර්ථික විද්‍යාව මෙරට පාසල් පද්ධතිය තුළ ජනප්‍රිය තාක්ෂණ විෂයයන් බවත්, ඒ අනුව නවීන තාක්ෂණ විෂයයන් තවමත් ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ප්‍රචලිත වී නොමැති බවත් අනාවරණය විය. වෛකල්පිත විෂයයක් වූ තාක්ෂණ විෂයය තෝරා ගැනීම ශිෂ්‍ය කැමැත්ත මත සිදුවන අතර, ගම්බද හා 2 වර්ගයේ පාසල් වල උගන්වන තාක්ෂණ විෂයයන් ඉතා සීමිත වන නිසා එම පාසල් වල සිසුන්ට තම තාක්ෂණ විෂයය තෝරා ගැනීම ගැටළුවක් වී ඇත. එමනිසා ගම්බද පාසල්වල සිසුන්ට හා 2 වර්ගයේ පාසල්වල සිසුන්ට තම තාක්ෂණ විෂයය ද අනිවාර්ය විෂයයක ස්වරූපය ගෙන ඇති බව හෙළි විය.

තාක්ෂණ විෂයය ඉගැන්වීමේදී සමස්ත පාසල් පද්ධතියම ගැටළු රැසකට මුහුණ පාන බවත්, විශේෂයෙන් ගම්බද පාසල් හා 2 වර්ගයේ පාසල් දැඩි භෞතික හා මානව සම්පත් හිඟයකට මුහුණපාන බවත් හෙළි විය. එසේ වුවද තාක්ෂණ විෂයයේ සාධනය ඉහළ මට්ටමක පවතින නිසා විභාග වලදී තාක්ෂණ විෂයයන්ගේ අසමත් වීමේ ප්‍රතිශතය අවම මට්ටමක පවතී. සිසුන්ට සිය ලැදියා හා හැකියා අනුව විෂයයන් තෝරා ගැනීමට අවස්ථාව ලැබීමෙන් සාධනය ඉහළ මට්ටමක පවත්වා ගත හැකිවා මෙන්ම, ශිෂ්‍ය අසමත් වීමේ ප්‍රතිශතය අවම මට්ටමක පවත්වා ගත හැකි බවද නිගමනය විය.

ද්විතීයික පාසල් තාක්ෂණ විෂයය තුළින් සිසුන්ට ලැබෙන වෘත්තීය නිපුණතා ප්‍රමාණවත් නොවන බවත්, ඒ සඳහා සිසුන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල ප්‍රායෝගික පුහුණුවක යෙදවීම සුදුසු බවත් හෙළි විය. එවැනි ආයතන වල සිසුන් ලබන ප්‍රායෝගික පුහුණුව අවසාන ඇගයීම හා එක් කිරීම වැදගත්ය. තාක්ෂණ විෂයයෙන් උපාධිය ලබා ගැනීමට වැඩි ශිෂ්‍ය පිරිසක් කැමැත්ත දැක්වූහ. සමාජ පිළිගැනීමක් නොමැතිකම, දෙමාපිය අකමැත්ත හා ඉහළ ආදායමක් නොලැබීම වැනි කරුණු තාක්ෂණ විෂයයන් වැඩි දුරටත් ඉගෙනීමට අකමැති සිසුන්ගේ ආකල්ප විය. වෘත්තීය නිපුණතා ලබා ගැනීම සඳහා පාසල් කාලය හා අ.පො.ස. (සා.පෙ) ප්‍රතිඵල ලැබෙන තෙක් කාලය සිසුන් වඩා ප්‍රිය කරන බවද අනාවරණය විය.

සේවායෝජකයන් වෘත්තිය නිපුණතා වශයෙන් හඳුනාගෙන ඇත්තේ රැකියාවක් කිරීම සඳහා සිසුන්ට ඇති හුරුව නොව, ඕනෑම රැකියාවක් කිරීමේදී අවශ්‍ය වන පෞරුෂය, නායකත්වය, සමස්ත චින්තනය, තර්කානුකූල චින්තනය හා සංනිවේදන කුශලතා වැනි ගුණාංග බව හෙළි විය. යෞවනයන්ට වෘත්තීය නිපුණතා ලබාදෙන ආයතන, දේශීය හා විදේශීය පෞද්ගලික අංශ, සිසුන්ට වෘත්තීය නිපුණතා ලබාදීම සඳහා පාසල් හා ඒකාබද්ධ විය යුතු බවද අනාවරණය විය.

අවසාන වශයෙන් රජය තවදුරටත් සිසුන් අතර ජනප්‍රිය සේවා යෝජකයා බවත්, එහිදී දිවයිනේ රැකියා සංයුතිය හා රැකියා අපේක්ෂණ සමතුලිත කිරීම සඳහා මෙරට ජනතාවගේ ආකල්ප පරිවර්තනය කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතින බවත්, හෙළිවිය.

මෙම පර්යේෂණයෙන් හෙළි වූ ගැටළු සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදී. පාසල් සිසුන්ගේ අධ්‍යාපන අපේක්ෂා උසස් අධ්‍යාපනයට සීමා නොකොට, සදාචාර සම්පන්න ශ්‍රමාභිමානයෙන් හා ජාත්‍යාලයෙන් යුත් ශ්‍රී ලාංකිකයෙකු බිහි කළයුතු ආකාරය පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලදී. පාසල් තාක්ෂණ විෂයය හතර වසරේ සිට ආරම්භ කළ යුතු ආකාරයත් 9–11 වසර වලදී ඉලෙක්ට්‍රෝනික් තාක්ෂණය, පරිගණක විද්‍යාව, භෝජනාගාර සේවය, රූපලාවණ්‍ය කටයුතු වැනි කාලීන රැකියා වෙළඳපල හා සම්බන්ධ තාක්ෂණ විෂයයන් එක් කළ යුතු ආකාරයත්, පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලදී. උසස් පෙළ තාක්ෂණය විෂයධාරාව සඳහා පරිගණක විද්‍යාව, යාන්ත්‍රික තාක්ෂණය, විදුලි හා ඉලෙක්ට්‍රෝනික් තාක්ෂණය, ගෘහනිර්මාණ ශිල්පය, මූර්ති හා සෙරමික් නිෂ්පාදන හා කලා ශිල්ප වැනි විෂයයන් එක් කළ යුතු බවත්, එහිදී විද්‍යා, කලා හා වාණිජ ක්ෂේත්‍ර අතර පවතින විභේදනය අවම වන පරිදි විෂයන් තෝරා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදිය යුතු බවත්, යෝජනා කරන ලදී.

පාසල් තාක්ෂණ විෂයය ඉගැන්වීමේදී පවතින භෞතික සම්පත් හිඟය පියවා ගැනීම සඳහා අධ්‍යාපන පිරිවැයෙන් වැඩි ප්‍රතිපාදන වෙන් කළ යුතු බවත්, ඊට අමතරව පාසල් වල ආදි ශිෂ්‍යයන්, ප්‍රජාව, විවිධ සංවිධාන හා දේශීය, විදේශීය පෞද්ගලික අංශය වෙත පාසල් පද්ධතියේ භෞතික සම්පත් හිඟය පිළිබඳ දැනුවත් කොට අවශ්‍ය ආධාර ලබාගත යුතු බවටත්, අදහස් ඉදිරිපත් කරන ලදී. එමෙන්ම සම්පත් බෙදියාමේ විෂමතාවය අවම කළ යුතු බවත්, ඊ සඳහා පළාත් අධ්‍යාපන පර්යේෂණ ඒකක ආරම්භ කොට, එම ඒකක වල නිර්දේශ මත සම්පත් බෙදීම සිදු කළ යුතු බවත්, යෝජනා කරන ලදී. තාක්ෂණ විෂයන් ඉගැන්වීමේදී පවතින මානව සම්පත් හිඟය සඳහා නව තාක්ෂණ ගුරුවරුන් බඳවා ගතයුතු අතර, එහිදී ජර්මානු කාර්මික විද්‍යාලය, ජාතික ආධුනිකත්ව මණ්ඩලය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය හා ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලවල අවසාන සහතික පත් දරන්නන් කෙරෙහි අවධානය යොමු කළ යුතු බවත්, යෝජනා කරන ලදී. මානව සම්පත් හිඟයට පිළියම් වශයෙන් විශ්‍රාමික තාක්ෂණ ගුරුවරු බඳවා ගැනීම, ගුරුවරු සමෝධානය කර ඉගැන්වීම, සංක්‍රමණික තාක්ෂණ ගුරුවරු පත්කිරීම හා ගුරු පුහුණුව ලබන කාලය තුළ තාක්ෂණ විෂයයක් අනිවාර්ය කිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී.

පාසල් මාර්ගෝපදේශ සේවාවක් ආරම්භ කළ යුතු බවත්, 9 වසරේ සිට ඉහළ වසරවල සිසුන්ට සති දෙකකට වරක් ඒ සඳහා කාලසටහනින් කාලච්ඡේදයක් වෙන් කළ යුතු බවත්, යෝජනා කරන ලදී. එමගින් දිවයිනේ රැකියා සංයුතිය හා රැකියා අපේක්ෂා අතර සමතුලිතතාවක් ඇති කිරීමටත්, පාසල් මට්ටමේදී යෞවනයන්ට වෘත්තීය නිපුණතා ලබදෙන ආයතන හඳුනා ගැනීමට අවස්ථාවක් ලබාදීමටත් කටයුතු කළයුතු ආකාරයත් යෝජනා කරන ලදී.

ශ්‍රී ලාංකික ජනතාව තුළ ශ්‍රමාභිමානය වැඩිකිරීම සඳහා ජනතාවගේ ආකල්ප පරිවර්තනයන් සිදු කිරීම අවශ්‍ය බවත්, ඒ සඳහා ජනමාධ්‍ය සතු විශාල වගකීමක් පවතින බවත්, විවිධ වැඩසටහන්, නාට්‍ය, ගීත, කෙටි වාර්තා චිත්‍රපට ආදිය මගින් ජනමාධ්‍ය මේ සඳහා උත්සාහ දැරිය යුතු බවත් යෝජනා කරන ලදි.

ජපානය, දකුණු කොරියාව වැනි පෙරදිග ආසියානු රටවල මෙන් ධීවර, කෘෂිකාර්මික, කාර්මික, වාණිජ, තාක්ෂණික හා විස්තීරණ ආදි විවිධ වෘත්තීන් අරමුණු කර ගත් ද්විතීයික පාසල් ශ්‍රී ලංකාව තුළ ආරම්භ කිරීමේ වැදගත් කමද අවධාරණය කරන ලදි.

මේ යෝජනා ක්‍රියාත්මක කිරීමෙන් 21 වන සියවසට ගැළපෙන අයුරින් ද්විතීයික පාසලේ තාක්ෂණික විෂය මාලාව නවීකරණය කළ හැකි බව පරියේෂකයාගේ විශ්වාසයයි.